ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

Press Notice No: HRC/P/i/S/24/06/25

# මාධ්‍ය නිවේදනය

## <u>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ සහ නිර්දේශ සම්බන්ධයෙනි</u>

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනත මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව පහත දක්වා ඇති පරිදි මාර්ගෝපදේශ සහ නිර්දේශ නිකුත් කිරීමට කටයුතු කර ඇත.

1. සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයින් ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති පොලිස් නිළධාරීන් සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහය
2. මානව හිමිකම් කොමිෂන් සභා පනත මගින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැවරී ඇති බලතල සම්බන්ධයෙන් දැනුවත් කිරීම
3. පුද්ගලයන් පොලිස් අත්අඩංගුවේ පසුවන අවස්ථාවකදී හා පොලීසිය සමග සිදුවන ගැටුමකදී සිදුවන මරණ වළක්වා ගැනීම පිළිබඳව ශ්‍රී ලංකා පොලීසිය වෙත යොමු කරනු ලබන 2025 අංක 01 දරණ පොදු මාර්ගෝපදේශ සහ නිර්දේශ
4. මානව හිමිකම් ආරක්ෂකයින් ආරක්ෂා කිරීම පිළිබඳ 2024 අංක 01 දරණ පොදු මාර්ගෝපදේශ සහ නිර්දේශ

ඒ අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මගින් නිකුත් කරන ලද උක්ත මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලීසිය දැනුවත් කිරීම සඳහා පොලිස්පති විසින් නිකුත් කරන ලද පොලිස් චක්‍රලේඛ පිළිබඳව 2025.06.20 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පොලිස්පතිතුමාට ප්‍රසාදය පල කරයි.

නිහාල් චන්ද්‍රසිරි

මාධ්‍ය ප්‍රකාශක/අධ්‍යක්ෂ - පර්යේෂණ හා අධීක්ෂණ අංශය.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

24.06.2025

දුරකථන අංකය : 011 2505595

විද්‍යුත් තැපැල් ලිපිනය : rm.director.hrcsl@gmail.com